# ග්‍රාමීය ප්‍රජාවගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණික කුසලතාවයන් වර්ධනය කිරීමෙහි ලා "නැණසල" ව්‍යාපෘතියෙහි දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරාගත් නැණසල මධ්‍යස්ථාන ඇසුරිනි.)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඩබ්ලිව්. එස්. කාංචනමාලා [1]**
**කේ. ඒ. ටී. චාමර [2]**

**සංක්ෂේපය**

සමස්ත ලෝකයම තොරතුරු තාක්ෂණය අනුව ඉදිරියට ගමන් කරන වකවානුවක රටක් වශයෙන් ශ්‍රී ලංකාවට එකී රාමුව තුළින් මිදී හුදකලා රාජ්‍යයක් ලෙස සමාජගත වීම රටෙහි සමස්ත පැවැත්මට විශාල තර්ජනයකි. එහෙයින් තොරතුරු තාක්ෂණය අප රටටද අත්‍යවශ්‍ය ප්‍රධානතම සාධකයකි. එම සංකල්පය ගරු කරමින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා අර්ධ නාගරික ජනතාව සියලුම තොරතුරු තාක්ෂණික දැනුමින් සන්නද්ධ කිරීම උදෙසා ප්‍රතිනිර්මාණය කර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපෘතියක් ලෙස "නැණසල" ව්‍යාපෘතිය පෙන්වා දිය හැකිය.

නැණසල ව්‍යාපෘතිය මඟින් ග්‍රාමීය ජනතාවගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය කුසලතා වර්ධනය කිරීම සඳහා දක්වන දායකත්වය අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. හම්බන්තොට දිස්ත්‍රිකයේ නැණසල මධ්‍යයස්ථාන 41 අතරින් මධ්‍යස්ථාන 10 ක සාමාජිකයින් අතර අහඹු නියදි ක්‍රමය යටතේ ප්‍රශ්නාවලි මඟින් දත්ත රැස්කරන ලදි. එසේම මෙම මධ්‍යස්ථාන දහයෙහි අයිතිකරුවන් වෙත ද ප්‍රශ්නාවලි ඉදිරිපත් කරන ලදි.

ග්‍රාමීය ප්‍රජාව තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණ භාවිතයට ඉහළ කැමැත්තක් ඇති බවත් නැණසල ව්‍යාපෘතිය මඟින් ඔවුන් තුළ නව තොරතුරු සන්නිවේදන කුසලතා වර්ධනයට සුවිශේෂී දායකත්වයක් ලැබෙන බවත් අනාවරණය විය. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ම ග්‍රාමීය තරුණ පිරිස් වෙත එනම් වයස් මට්ටම 19 -25 දක්වා පිරිස්වල වැඩි අවධානයක් එනම්, එය ප්‍රතිශතයක් ලෙස 86% පමණ දිනාගෙන ඇති බවත්, ඉන් වැඩි පිරිසක් උසස් අධ්‍යාපනය හදාරන පිරිස් හා රැකියා විරහිත තරුණ තරුණියන් වේ. නැණසල මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන්නා වූ පාඨමාලා හා වැඩසටහන් වෙත සම්බන්ධ වීම ඉහළ මට්ටමක පවතින අතර නැණසල භාවිත කරන්නන්ගෙන් 95% ක්ම සැලසෙන සේවාව පිළිබඳ ව තෘප්තිමත්ය. නමුත් ඔවුන් තෘප්තිමත් නොවන සාධක ද හඳුනාගත හැකි වූ අතර ඒ අනුව පවතින භෞතික පහසුකම්වල හිඟතාවය, ඇතැම් පාඨමාලාවන් ප්‍රමිතියකින් තොරවීම, නැණසල මධ්‍යස්ථාන නඩත්තුව සඳහා ක්‍රමවත් වූ වැඩපිළිවෙළක් නොමැති වීම වැනි ගැටලු කිහිපයක් දැකගත හැකි විය.

ශීඝ්‍රයෙන් වෙනස් වන තොරතුරු තාක්ෂණයේ වෙනස්කම්වලට සුදුසු වන ආකාරයේ ඵලදායී පුහුණු පාඨමාලාවන් මෙම ව්‍යාපෘතියට ඇතුළත් කිරීම හා සුදුසු පරිදි පසුවිපරම් ක්‍රමවේදයක් තුළින් ව්‍යාපෘතියේ ඵලදායීතාවය ඉහළ නැංවීමේ යාන්ත්‍රණයක් ගොඩනැගීම සිදුකළ හැකි ය.

**ප්‍රමුඛ පද - තොරතුරු තාක්ෂණය, නැණසල, ග්‍රාමීය ප්‍රජාව, සන්නිවේදන කුසලතා**

*1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය,*

*ශ්‍රී ලංකාව* soori.222km@gmail.com

*2. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*
chamara@kln.ac.lk